WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

සිංහල භාෂාව හා සාහිත්‍යය I, II
சிங்களமொழியும் இலக்கியமும் I, II
Sinhala Language and Literature I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

**උපදෙස් :**

(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** ලැබේ.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.
(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

● අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

**1.** එක් වර ම සභාව **මියට පිම්බාක් මෙන්** විය.
(1) තැනින් තැනින් ඉතා සුළු ශබ්ද මතු වූවාක් මෙන්
(2) කිසිදු ශබ්දයකින් තොර වූවාක් මෙන්
(3) කිහිප දෙනකු කතා කරද්දී අනික් අය නිහඬ වූවාක් මෙන්
(4) ඉහළට ඇද ගත් හුස්ම පහළට නොදමන්නාක් මෙන්

**2.** පොලිස් නිලධාරියා දුටු වහා ම සොරා **ගල් ගැසුණේ ය.**
(1) හිස නමා ගෙන සිටියේ ය. (2) බිමට නැමී සිටියේ ය.
(3) නො සෙල්වී සිටියේ ය. (4) දැත නො සෙල්වූයේ ය.

**3.** ජයග්‍රාහකයා **ඉහ වහා ගිය සතුටින්** ඔල්වරසන් දුන්නේ ය.
(1) ඉහටත් උඩින් ගිය සන්තෝෂයෙන් (2) සියල්ලන් පරදවන සතුටකින්
(3) සතුටු සහගත සිතින් (4) අධික වූ සන්තෝෂයෙන්

● අංක **4** සිට **6** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

**4.** රටක ආර්ථිකය කඩා වැටීම ඒ රටෙහි .............................. හානිකර ය.
(1) ස්ථාවරත්වයට (2) අස්ථාවරත්වයට (3) ප්‍රමුඛත්වයට (4) සුන්දරත්වයට

**5.** මේ පොත තමා විසින් ම ලියන ලද හෙවත් ...................................... චරිත කථාවකි.
(1) ස්වයං භාෂිත (2) ස්වයං නිර්මිත (3) ස්වයං ජනිත (4) ස්වයං ලිඛිත

**6.** 'ඎ' යන අක්ෂරය සිංහල භාෂාවෙහි ................................ යෙදේ.
(1) අවිශේෂයෙන් (2) දුර්ලභ ව (3) සුලභ ව (4) නිරන්තරයෙන්

[දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

7. සැම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය
(1) මිණිමෙවුළ, භෞතික, භීෂණය, දලදඬු
(2) දෝලනය, ඡේදය, ගුරුලා, ගිනුම
(3) කොළය, පර්යේෂණ, නිගණ්ඨ, සක්වළ
(4) ප්‍රත්‍යක්ෂ, ආශ්චර්ය, සැණකෙලි, අනබෙරය

8. ගිගිරි, කොක්ක, කුඹියා, සාගරය යන වචනවල **පළමු අකුරෙහි** අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) කෙටි ඉස්පිල්ල, ඇලපිල්ල, දිගු පාපිල්ල, කොම්බුව
(2) දිගු පාපිල්ල, කොම්බුව, කෙටි ඉස්පිල්ල, ඇලපිල්ල
(3) ඇලපිල්ල, දිගු පාපිල්ල, කෙටි ඉස්පිල්ල, කොම්බුව
(4) කෙටි ඉස්පිල්ල, කොම්බුව, දිගු පාපිල්ල, ඇලපිල්ල

9. 'තනතුර' යන පදයෙහි අන්තර්ගත ව්‍යඤ්ජන අක්ෂර වර්ග වනුයේ,
(1) දන්තජ හා මූර්ධජ ය. (2) දන්තජ හා ඕෂ්ඨජ ය.
(3) තාලුජ හා දන්තජ ය. (4) තාලුජ හා මූර්ධජ ය.

10. අකාරාදි පිළිවෙළ **නිවැරදි ව** දැක්වෙන පද පේළිය තෝරන්න.
(1) අඹ, අන්නාසි, අනෝදා, ඇපල්
(2) පේර, රඹුටන්, දෙළුම්, පැපොල්
(3) දිවුල්, නාරං, වරකා, හිඹුටු
(4) උගුරැස්ස, කෙසෙල්, මිදි, දොඩම්

11. අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) ඇතින්නක, මුගටියන්, සිංහයෝ, වඳුරා
(2) භික්ෂුවක, යාචකයන්, ළදරුවෙක්, වලසෙක්
(3) කුහුඹියෙක්, මානවයෙක්, සිවුපාවකු, රජකු
(4) කුරුල්ලකු, කිකිළියන්, වඳුරකු, ගුරුවරුන්

12. 'විදේශ සංචාරකයෝ දුම්රියෙන් බදුල්ලට යති' යන වාක්‍යයෙහි '**දුම්රියෙන්**' යන්නෙහි විභක්තිය කුමක් ද?
(1) කරණ (2) අවධි (3) කර්තෘ (4) සම්බන්ධ

13. 'යකඩදොර' යන්න අයත් වන්නේ,
(1) අන්‍යාර්ථ සමාසයට ය. (2) විශේෂණ සමාසයට ය.
(3) අව්‍යය සමාසයට ය. (4) විභක්ති සමාසයට ය.

14. 'සුන්දර + ය' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට සකස් වන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
(1) සුන්දරය (2) සෞන්දර්ය (3) සෞන්දර්‍ය (4) සෞන්දරය

WWW.OLEVELAPI.COM

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නොවන** පදයක් සහිත වරණය තෝරන්න.
(1) කෘදන්ත - දුවන, පනින, නටන, ගයන
(2) තද්ධිත - බලවත්, සිල්වත්, ඉසුරුමත්, අසිරිමත්
(3) මිශ්‍ර ක්‍රියා - කරමින්, දමමින්, ලියමින්, බලමින්
(4) නිපාත - දක්වා, පටන්, මෙන්, සෙන්

16. **අසම්භාව්‍ය ක්‍රියාවක්** යෙදී ඇති වාක්‍යය කුමක් ද?
(1) දරුවා අඬ අඬා දිවුවේ ය.
(2) මඟිය, වහා ගමට යව.
(3) ඔවුන් වැඩ කරද්දී අපි බලා සිටියෙමු.
(4) තරුණිය සිනා සී පෙර මගට ආවා ය.

● අංක **17** සිට **19** තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

17. ඇයගේ **මන්දස්මිතය** කෙරෙහි ඔහුගේ සිත ඇදී ගියේ ය.
(1) පිරුණු සිනහව (2) මඳ සිනහව
(3) ළගන්නා සිනහව (4) සුන්දර සිනහව

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

18. නිවේදකයාගේ **කර්ණකඨෝර** ශබ්දය බොහෝ දෙනාගේ කතාබහට ලක් විය.
(1) කනට ඉමිහිරි (2) කන්කලු වූ
(3) කන් පිනා යන (4) කනට අමිහිරි

19. **සුවාසූදහසක්** යොදුන් දුර ඇත්තේ ය.
(1) අසූ දහසක් (2) අසූ දහස් හතරක්
(3) අසූහාර දහසක් (4) අසූහාර දහස් හතරක්

20. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමඟ බැඳී **නොපවත්නා** පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.
(1) උදැල්ල, නඟුල, හිරමනය, ඇකැත්ත
(2) ළිඳ, වතුර, බාල්දිය, කළය
(3) මාලය, මුද්ද, වළල්ල, කරාබුව
(4) කෝප්පය, ජොග්ගුව, කේතලය, හැන්ද

21. එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් වරණය තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| (1) | මුහුද - සිඳු, | මිතුරු - පසමිතුරු, | වක්‍ර - රවුම්, | අත - බාහු |
| (2) | අග්නි - ගිනි, | නාසය - නැහැය, | භූමි - පොළොව, | තාරකා - තරු |
| (3) | පුස්තක - පොත, | ඥාති - නෑ, | වෘක්ෂ - ශාඛා, | මීයා - මූෂික |
| (4) | ගිරි - පර්වත, | නාග - නා, | කේශ - රෝම, | ප්‍රාකාර - අගල |

22. මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) සිංහ - සිහ, මෘගරාජ, බාසුරු, මිගිඳා (2) වනය - කැලය, වනාන්තරය, අටවි, මූකළාන
(3) ගවයා - වෘෂභ, ගොනා, හරකා, මෘග (4) කිරණ - රශ්මි, කාන්ති, රැස්, කැන්

23. **විරුද්ධාර්ථවත්** පද යුගලයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.
(1) මධුර - සුමධුර (2) සරල - සංකීර්ණ
(3) දේශීය - විදේශීය (4) ආගමන - විගමන

24. **වැරදි** අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
(1) 'එම්බල' යනු ආමන්ත්‍රණාර්ථයෙහි නිපාතයකි.
(2) 'නුඹ' යන්න මධ්‍යම පුරුෂ, ඒක වචන නාම පදයකි.
(3) 'ය, ර, ල, ව' යනු අන්තඃස්ථාක්ෂර ය.
(4) 'නරියෙක්' යන්නෙහි අනුක්ත රූපය 'නරියා' යන්න යි.

25. පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත, අර්ථාන්විත වාක්‍යය තෝරන්න.
(1) තැනිතලා, කඳු මුදුන් පසු කර යන ගංගා ජලය ආරම්භයේ දී ම සමුද්‍රයට එක් වේ.
(2) පාඨශාලා අධ්‍යාපනයේ මුඛ්‍ය ප්‍රතිලාභ අත්කර ගනුයේ ශිෂ්‍යයන් නො ව ගුරුවරුන් ය.
(3) මානව වර්ගයාගේ උන්නතිය සඳහා ප්‍රබුද්ධ මනසක් ද නීරෝගී ශරීරයක් ද අවශ්‍ය ය.
(4) ජලභීතිකා රෝගය නිසා සුනඛයන් පමණක් මරණයට පත් වනු දැක ගත හැකි ය.

● අංක **26, 27** ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

26. උගතුන් නැති තැන, මඳක් ඉගෙන ගත් තැනැත්තා ද උගතකු වශයෙන් පිළිගැනෙන බව
(1) ලූලා නැති වළට කණයා පණ්ඩිතයා ලු.
(2) ඉස්සෙල්ල ආපු කනට වඩා පස්සෙ ආපු අඟ ලොකු ලු.
(3) නටන්න බැරි මිනිහට පොළොව ඇදයි ලු.
(4) නිවට කරනවෑමියා දැක්ක ම එළුවත් රැවුල පානව ලු.

27. සිතෙහි හටගත් කෝපය තිසි අයුරින් නොව වෙනත් ක්‍රමයකින් පිටකර හැරීම
(1) ගමරාල සිල් ගත්තා වාගේ
(2) ඉබ්බාගෙන් පිහාටු ගන්නවා වාගේ
(3) ගලෙන් පට්ටයක් ගන්නා වාගේ
(4) මුවහමට තඩි බාන්නා වාගේ

[හතරවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**28.** ස්වර සන්ධියට හා පූර්ව රූප සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) කම්මල, උනුන් (2) උනුන්, කම්මල
(3) උනුන්, අද්දැකීම (4) අද්දැකීම, කම්මල

● අංක **29, 30** යටතේ දක්වා ඇති ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූල ව නිවැරදි** වාක්‍යය තෝරන්න.

**29.** (1) සැමට සමාන ව සලකන උත්තමයකු බිහි වේවා!
(2) ගුරුවරු දරුවන්ගේ අනාගත යහපත වෙනුවෙන් වැඩ කළ යුතු ය.
(3) බොහෝ බුද්ධිමත්තු සැදැහැවත්තු නො වෙති.
(4) ශ්‍රී ලංකාව නොහොත් ඉන්දියන් සාගරයේ මුතු ඇටය අසිරිමත් දිවයිනකි.

**30.** (1) අක්කා ද මල්ලී ද මම ද පොත් පාඩම් කරමු.
(2) නගරාධිපති බලවතෙක් ද ධනවතෙක් ද ගුණවතකු ද වූයේ ය.
(3) ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාව මෙවර තරගයට ඉදිරිපත් වන්නේ ය.
(4) දරුව, නිවටයෙක් සේ වැඩ නො කරව' යි තාපසයා කී ය.

**31.** ● දානපතියා අසරණයන්ට සැලකුයේ පින් .............................. ය.
● මෙහි ගැහැනු ළමයින්.............................. නවාතැන් පහසුකම් ඇත.
● ඒ ඉඩම් වෙන්දේසිය .............................. නගරාධිපතිගේ ප්‍රසාදයක් නො වී ය.
● දේශකයා සම්මන්ත්‍රණය පැවැත්වූයේ දෙමාපියන් .............................. ය.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?
(1) ගැන, අරබයා, සඳහා, පිණිස (2) අරබයා, ගැන, සඳහා, පිණිස
(3) පිණිස, සඳහා, ගැන, අරබයා (4) සඳහා, ගැන, පිණිස, අරබයා

**32.** පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"ඉලංදාරියා හැමදාම හැන්දෑ ජාමෙට වහං වෙනවා"
(1) තරුණයා සෑම දිනක ම හවසට සැඟවුණේ ය.
(2) තරුණයා සැමදා ම රාත්‍රියෙහි සැඟවෙන්නේ ය.
(3) තරුණයා සෑම දවසක ම සන්ධ්‍යාවෙහි හැංගුණේ ය.
(4) තරුණයා සෑම දිනක ම සන්ධ්‍යා වේලාවෙහි සැඟවෙයි.

**33.** පහත දැක්වෙන ගීත ඛණ්ඩයේ අවසන් කොටස නිවැරදි ව දැක්වෙන උත්තරය තෝරන්න.

මාණික්‍ය සේ පොළෝ ගැබේ නිධාන වී
ඇත්තෙ ඒ අභීත දූ පුතුන්
ජාතියේ නාමයෙන්
සංග්‍රාම භූමියේ

..............................

WWW.OLEVELAPI.COM

(1) වීරයන්ගෙ ඒ යශෝ ගීතයයි.
(2) එන්නෙ උන් හෙළූ ප්‍රාණ වායුවයි.
(3) ජීවිතේ පුදා හැළූ ලේ කඳයි.
(4) සාර වූ උදාර වූ මාතෘ භූමියයි.

**34.** 'ශූර අසරුවෙකු අසුන් මෙල්ල කරමින් විස්මයාවහ දක්ෂතාවන් විදහා දක්වන්නාක් මෙන්, නිපුණ සාහිත්‍යකරුවා ද පාඨකයාගේ සිත විස්මයෙන් පුරවා දමමින් බස පාලනය කරයි'
ඉහත ප්‍රකාශයේ අදහස නිවැරදි ව කියැවෙන වාක්‍යය තෝරන්න.
(1) දක්ෂ අසරුවෙකු අසුන් මෙල්ල කරමින් පුදුමය උපදවන දස්කම් දක්වන්නාක් මෙන්, නිපුණ සාහිත්‍යකරුවා ද පාඨකයාගේ බස හසුරුවන්නේ විස්මය දනවන අයුරිනි.
(2) දක්ෂ අසරුවෙකු විස්මයෙන් යුතුව අසුන් මෙල්ල කරන්නාක් මෙන්, නිපුණ සාහිත්‍යකරුවා ද පාඨකයා විස්මයට පත් කරමින් බස හසුරුවයි.
(3) දක්ෂ අසරුවෙකු අසුන් මෙල්ල කරමින් විස්මය දනවන්නාක් මෙන්, නිපුණ සාහිත්‍යකරුවා ද බස හසුරුවමින් පාඨකයාගේ සිත විස්මයට පත් කරයි.
(4) දක්ෂ අසරුවෙකු අසුන් මෙල්ල කරමින් විස්මය දනවන ලෙස දස්කම් දක්වන්නාක් මෙන්, නිපුණ සාහිත්‍යකරුවා ද පාඨකයාගේ සිත විස්මයට පත් වන ආකාරයට බස හසුරුවයි.

[පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**35.** 'ඇතැ ධූලින් වැසී ගිය ඇත් රජයැ මැතැ සවණක් ඝන බුදු රසින් සැදී ගිය බුදුරජාණෝ යැ. ඇතැ කෝපයෙන් රත් වැ ගිය යවට වැනි ඇස් ඇති ඇත් රජයැ. මැතැ කරුණායෙන් තෙත් වැ ගිය නිල් මහනෙල් පෙති පරයන ඇස් ඇති බුදුරජාණෝ යැ...'
යනාදි වශයෙන් ඇති පාඨය අන්තර්ගත වන කෘතිය කුමක් ද?

(1) පූජාවලිය (2) බුත්සරණ
(3) අමාවතුර (4) සද්ධර්මරත්නාවලිය

**36.** ''වෛද්‍ය විද්‍යාලයෙන් මට වැටුපක් ලැබෙනවා. එය මට ප්‍රමාණවත්. ජාතික ඖෂධ ප්‍රතිපත්තිය මා සිතන හා පතන ආකාරයට ක්‍රියාත්මක කිරීමට ලැබුණොත් එය මට සතුටක්.'' මේ ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(1) මහාචාර්ය කාලෝ ෆොන්සේකා (2) ආචාර්ය ඊ. ඩබ්. අදිකාරම්
(3) මහාචාර්ය සේනක බිබිලේ (4) මහාචාර්ය සෙනරත් පරණවිතාන

**37.** කෝට්ටේ අවධියේ දී රචනා කරන ලද සන්දේශ කාව්‍යයක් නොවන්නේ මින් කුමක් ද?

(1) පරෙවි සන්දේශය (2) සැළලිහිණි සන්දේශය
(3) ගිරා සන්දේශය (4) මයූර සන්දේශය

**38.** ''අතිගම්භීර ප්‍රපාතයෙහි වැටී ක්ෂුධාවෙන් පෙළී කෙඳිරිගාමින් හොත් පුරුෂයා දැක ...'' යන පාඨයෙහි 'ක්ෂුධාවෙන්' යන්නෙහි අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

(1) මහන්සියෙන් (2) කුසගින්නෙන්
(3) පිපාසයෙන් (4) බියෙන්

**39.** රූපකයක් ඇතුළත් වන උත්තරය තෝරන්න.

(1) ජීවන ගංගාව (2) රිය සකයුරු
(3) ඉඳුනිල් මිණි රුවනක් බඳු (4) දිසි රනලියෙව්

**40.** ධීවර වෘත්තිය ආශ්‍රිත භාෂා ව්‍යවහාරයේ දී 'මරක්කලාහේ' යනු

(1) දැල් අදින පුද්ගලයා ය. (2) ඔරු අයිතිකරුවා ය.
(3) ධීවර කණ්ඩායමේ නායකයා ය. (4) ඔරුව පදවන පුද්ගලයා ය.

* *

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...